## කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව
## කුරුණෑගල දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 26 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නිම්වැඩ වටිනාකම රු. 953,508 ක් වූ ඉදිකිරීම් 03 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වටිනාකම් ගිණුම්ගත කළ යුතු වේ. | මෙම ඉදිකිරීම් වටිනාකම් අතපසු වීමකින් ගිණුම්ගත වී නොමැති අතර 2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ජර්නල් සටහනක් මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ගිණුම් විෂයයන් 05 කට අදාලව මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන අතර රු.378,210 ක නොසැසඳීම් පැවතුණි. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්තුමා හා විගණනය විසින් ලබාදෙන උපදෙස් අනුව නිවැරදි කර ගැනිමට කටයුතු කරමි. |
| (ඇ) | රු.3,881,071 ක් වූ ලී බඩු සවි කිරීම සම්බන්ධයෙන් උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | උපලේඛන පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | ආරම්භයේ සිටම වාර්ෂිකව මිලදී ගත් වටිනාකම් ගිණුම සකස් කිරිමේදී ගිණුමට ගෙන ඇති නමුත් ඉන්වෙන්ට්‍රි ලේඛනවල වටිනාකම් සඳහන් නොවීමෙන් උපලේඛනයක් නිවැරදිව සකස් කිරිමට නොහැකි වී ඇත. |

**1.4** **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති 19 | උප පත්‍රිකා පොත්වල සුරක්ෂිතභාවය හා නිසි භාවිතය පිළිබඳ වඩාත් සැලකිලිමත් විය යුතු වුවත්, නිලධාරීන්ට ලබා දුන් උප පත්‍රිකා පොත් නැවත භාරගැනීමකින් තොරව නැවත නැවත නිකුත් කර තිබුණි. | නිකුත්කරන ලද උපපත්‍රිකා භාරගැනීමකින් තොරව නැවත නිකුත් නොකළ යුතු වේ. | විගණන වාර්තාවේ දී ඇති උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරමි. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,813,092 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,270,532 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | වර්ෂය 2018 | | | | වර්ෂය 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය | ඇස්තමේන් තුගතආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 1,320,385 | 1,621,278 | 1,546,870 | 359,540 | 805,000 | 1,110,000 | 1,063,000 | 263,000 |
| II. | බදු කුලී | 3,535,295 | 3,870,278 | 3,841,602 | 30,682 | 3,245,000 | 3,572,000 | 3,577,000 | 8,000 |
| III. | බලපත්‍ර ගාස්තු | 1,029,100 | 1,191,874 | 1,191,874 | - | 1,026,000 | 1,046,000 | 1,046,000 | - |
| IV. | වෙනත් ආදායම් | 46,534,400 | 45,544,898 | 76,313,174 | 14,105,121 | 42,530,000 | 50,419,000 | 44,625,000 | 25,888,000 |
| එකතුව | | 52,419,180 | 52,228,328 | 82,893,520 | 14,495,343 | 47,606,000 | 56,147,000 | 50,311,000 | 26,159,000 |

## 2.2.2 බදු කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු පදික කඩ කාමර 3 ක් සඳහා 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා දිනකට රු. 30 බැගින් කුලී අයකර තිබූ අතර කඩකුලී තක්සේරු කර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | කුලී මුදල තක්සේරුකර ගිවිසුම්ගතව කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී තක්සේරු කිරිමට හා ඒ අනුව කටයුතු කරමි. |

## 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,200,000 ක් හා මුද්දර ගාස්තු රු. 10,000,000 ක් විය. | උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු ලබාගෙන අයවැයගත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදියි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට සම්මත අතුරු ව්‍යවස්ථාවට අමතරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා දෙකක් සභාව විසින් වැළඳගෙන තිබුණි. | සභාව විසින් වැළඳගත්/ පැනවූ අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කළ යුතු අතර අවශ්‍යතාවය අනුව නව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

**(ආ) පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා ව්‍යාපාර බදු ගෙවා තිබූ ලී මෝල් 02 ක්, වී මෝල් 31 ක්, සිමෙන්ති/ මැටි භාණ්ඩ නිපදවන ආයතන 11 ක්, කොහු නිෂ්පාදන හා පොල් ලෙලි කපන ව්‍යාපාර 29 ක්, වඩුමඩු 21 ක් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍ර අළුත්කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පරිසර බලපත්‍ර අළුත් කිරීමේ කාලසීමාව ඉදිරියට ඇති හෙයින් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව දැනුවත්ව සිටියද සමාලෝචිත වර්ෂයේ අයවැය | වාර්ෂික අයවැය පිළියෙල කිරීමේදී 2030 න්‍යාය පත්‍රයට | පිළිගනිමි. |

| | |
|---|---|
| පිළියෙල කිරීමේදී ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි. නමුත් න්‍යාය පත්‍රයේ වූ කරුණු ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. | අනුව වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 07 ක් ස්ථාපිත කර තිබූ අතර මෙම කුළුණු ඉදිකිරීමේදී අයකළ යුතු ගාස්තු අයකළ බවට වූ සනාථ කිරීම් සහා ලේඛනවල නොතිබූ අතර උක්ත කුළුණුවලට අදාළව අනුකූලතා සහතික නිකුත්කර නොතිබුණි. | 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා සංශෝධන ප්‍රකාරව ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා ගොඩනැගිලි අයදුම්පත් අනුමත කර දීම පමණක් මෙතෙක් සිදුකර ඇත. මෙම දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 07 සම්බන්ධයෙන් වන තොරතුරු වර්ෂ10 කටත් එහා ගොනුවල අඩංගු වන බැවින් නිවැරදි පිළිතුරක් සැපයීම සඳහා එම ගොනු සොයාගැනිමට අපහසු බව දන්වා සිටිමි.මේ වන විට ඉදිකර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා අනුකූලතා සහතික ලබා ගැනිමට කටයුතු කරන ලෙස අදාළ සමාගම් වෙත දන්වා යවා ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික සේවාවන්ට අදාළව අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා අනියම් / ආදේශක / කොන්ත්‍රාත් හා දෛනික දීමනා මත සේවකයින් 07 ක් බඳවාගෙන තිබුණි. | කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දෛනික කටයුතු කරගෙන යාමේදී මෙම අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, දෛනික දිමනා මත බඳවාගෙන ඇති මෙම සේවකයින් 07 දෙනාගෙන් සැළකිය යුතු සේවාවක් ඉටු වන බව දන්වා සිටිමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා කාර්යාලය, පුස්තකාලය, ක්‍රීඩා පිටිය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි අක්කර 06 ක් පමණ වූ ඉඩම සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීම් කටයුතු කාර්යක්ෂමව ඉටු කරගත යුතු වේ. | මෙම ඉඩම පවරා ගැනිමට අදාළව කටයුතු සිදු කරමින් පවතියි. අදාළ තොරතුරු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. |

### 3.4.2 නිෂ්ක්‍රීය /ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කැබ් රථයක් සභාවේ නමට පවරා ගැනීම් කටයුතු සම්පූර්ණ නොවීම හේතුවෙන් එහි අළුත්වැඩියා කටයුතු කරගත නොහැකිව ධාවනයෙන් ඉවත්කර වර්ෂ 03කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණි. | කැබ්රථය අළුත්වැඩියා කර ධාවන කටයුතු සඳහා යොදවාගත යුතු වේ. | මෙම කැබ් රථය නැවත අලුත්වැඩියා කිරිම සඳහා යොමුකර ඇත. |

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර ඇත. |